M 103
86
24

# ලාංකික ජනශ්‍රැතිය තුළින් පිළිබිඹුවන අධ්‍යාපන චින්තනය.

අධ්‍යාපන දර්ශනපති උපාධිය 1980 - 1981.

එම්පිල්. 117.

අධ්‍යාපන පීඨය

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය

කොළඹ.

UCLIB
379051

පෙරුම්බුලී අච්චිල්ලාගේ ගුණරත්න,
ඇම්. ඒ. ( ලංකා ) සිංහල.
අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන).

## සාරාංශය.

ලාංකික ජනශ්‍රැතියෙන් පිළිබිඹු වන අධ්‍යාපන චින්තනය මත කරන ලද පර්යේෂණයේ දී අරමුණ වූයේ -

1. දහසය වන සියවසේ සිට ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයින්ගේ බලපෑම්වලට ගොදුරු වීමෙන් යටපත් වූ ලාංකික ජනශ්‍රැතියෙන් පිළිබිඹු වන අධ්‍යාපන චින්තනය කෙබඳු එකක් දැයි විමසා බැලීම,

11. එයින් හෙළිවන අධ්‍යාපන වටිනාකමක් ඇති නෛසර්ගික ජීව ශක්තියෙන් යුත් සනාතන ධර්මයන් අඩංගු චින්තන රටාව නූතන අධ්‍යාපන ක්‍රියාවලියට යොදා ගැනීමට ඇති අවකාශය සොයා බැලීම

යන කරුණුය.

කවර සමාජයක වුවද කාලාන්තරයක් තිස්සේ වැඩෙමින්, පරිණාම වෙමින් ඉදිරියට ගලා ආ ජනතාවට උරුම වූ ආවේණික වූ ජනශ්‍රැතියෙන් උකහා ගත හැකි අධ්‍යාපන වටිනාකම් ඇති ජාතික දායාදයන් අන් කෙබඳු දැයකටත් වඩා අධ්‍යාපන ක්‍රියාවලියට සමීප වන්නේය. ඒවා අතීතයේ නටබුන් නොව, පොදු උරුමයන්ය.

ඒවා අතීතයට වඩා වර්තමානයට සමීපවන ආකාරයත්, 'ජනශ්‍රැතිය' යන සංකල්පයත්, එහි විශේෂ ලක්ෂණත්, එයට අයත් විෂය ක්ෂෙත්‍රයත්, එය අධ්‍යාපනයට හා අධ්‍යාපන කාර්යයට අදාල වන ආකාරයත් පෙන්වීම මෙහි ප්‍රථම පරිච්ඡේදයේ උත්සාහය වේ.

ලාංකික ජන කථාවල ස්වරූපය, ජන කථා සම්ප්‍රදාය, ජන කථා හා බණ කථා ලාංකික ජන කථා වර්ගීකරණය වැනි කරුණු අවධානයට යොමු කර අත්දැකීම් පෝෂණය සඳහා ජන කථා ප්‍රධාන අධ්‍යාපන කාරකයක් වශයෙන් ක්‍රියාත්මක වී ඇති ආකාරය විමසීම දෙවන පරිච්ඡේදයේ අරමුණ විය.

ජන කවි සම්ප්‍රදාය හා එයින් පිළිබිඹු වන අධ්‍යාපන චින්තනය මතු කොට, සදාචාර අධ්‍යාපනය සඳහා ජන කවිය පාදක කොට ගත් ආකාරයත්, එය නූතන පංති කාමරයට යොදා ගැනීමට ඇති අවකාශයත් සොයා බැලීම තුන්වන පරිච්ඡේදයේ අරමුණයි.

ජන සංගීතය, ජන වෙදකම, ජන නැටුම්, ජන කලා හා ජන ක්‍රීඩා යන විෂයයන් ජන ආගමේ එන යාතු කර්ම කේන්ද්‍ර කොට ගෙන ප්‍රභවය ලබා විකාශනය වී ඇත. එම අධ්‍යාපන චින්තනය ස්වභාව ධර්මය හා සමබර ලෙස පෞරුෂ වර්ධනය කිරීමට සමත් වී ඇත. ශාරීරික, මානසික, චිත්තවේගික හා සාමාජික යන අංශයන් සමබර ව පෝෂණය කිරීමට සමත් විය. දැනීම, ආකල්ප හා කුසලතා සමබර ලෙස වර්ධනය කිරීමට යොදා ගත් එම චින්තන ක්‍රමයත්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියත්, නූතන අධ්‍යාපන ක්‍රම-යට කොතෙක් දුරට යොදා ගැනීමට අවකාශ ඇත්තේ දැයි සොයා බැලීමට සතර වන පරිච්ඡේදය කැප විය.

පස්වන පරිච්ඡේදය ලාංකික සිරිත් විරිත්වලින් හෙළි වන ප්‍රාග් විද්‍යාත්මක චින්තන-යේ විද්‍යාත්මක මුහුණුවරක් නැත්තේ දැයි පෙන්වීමට ගත් උත්සාහයකි. එය අනාගත විද්‍යාත්මක පර්යේෂණ කාර්යයට සැඟ වී ඇති තැන් පෙන්වන්නකි.

මෙහි ඉදිරිපත් කර ඇති කරුණු එක් එක් තේමා යටතේ පරීක්ෂා කර ඇත්තේ විවරණ පහසුව සඳහාය. ලාංකික ජනශ්‍රැතිය ඇසුරෙන් පිළිබිඹු වන අධ්‍යාපන චින්තනය එසේ කොටස් වශයෙන් එකිනෙකින් ලැබූ දායාදයක් නොව විවිධ විෂයයන් පාදක කර ගත් අත්-දැකීම්වලින් සමෝධානිත ව ලැබූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. එම කරුණු පදනම් කොට සොයා ගන්නා ලද කරුණු ඇසුරෙන් මතු කරන ලද නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම අවසාන පරිච්ඡේදයේ අදහස විය.

* * * * * *